ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය : SP/SB/06/11

මගේ අංකය: SB/5/1/ICTA/Re-Gov

2011 ජූනි මස 24 වැනිදා

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්**
**පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්**
**දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්**
**ප්‍රාදේශීය ලේකම්වරුන්**

**ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය රාජ්‍ය ආයතනයන්හි ක්‍රියාත්මක කිරීම**

2009 දෙසැම්බර් 16 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය සියලු රාජ්‍ය ආයතනයන් විසින් ක්‍රියාත්මක කළ යුතු අතර එහි ප්‍රගති විමර්ශනය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) වෙත පවරා ඇත. එසේම ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ඇතුළු සමස්ත රාජ්‍ය අංශය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන මවිසින් සභාපතිත්වය දරනු ලබන ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව විසින් අධීක්ෂණය කරනු ලැබේ.

ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ ව බහුතරයක් රාජ්‍ය ආයතන දැනුවත් කොට ඇති අතර ඒ අනුව 2010 දෙසැම්බර් 31 දින දක්වා ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දර්ශකයක් සකසා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනයේ වෙබ් අඩවියෙහි පළ කොට ඇත (http://www.icta.lk/index.php/en/e-government-policy). මෙම දර්ශකය අනුව බහුතරයක් රාජ්‍ය ආයතන ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය අවම කරමින් හෝ ක්‍රියාත්මක කිරීමේ මට්ටමට පැමිණ නැති බව පෙනී යයි. මෙම කණගාටුදායක තත්ත්වයට ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ සංකීර්ණ භාවය ද හේතු වී ඇති හෙයින් රාජ්‍ය ආයතන ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය හා අනුගතවීමේ ක්‍රියාවලිය පහත දැක්වෙන අන්දමින් අදියර තුනකින් සම්පූර්ණ කිරීමට පහසුකම් සැලසීමටත් ඒ අනුව ප්‍රගතිය විමර්ශනය කිරීමටත් තීරණය කරන ලදී.

**අදියර 1 – 2011 ජූලි 15 දින දක්වා**

මෙම අදියර තුළ දී මූලික ව වැදගත් වන ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති අවශ්‍යතා 40 ක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව ඇගයීමක් සිදු කෙරෙනු ඇත. එම ඇගයීමට අනුව 2011 ජූලි 15 දිනට රාජ්‍ය ආයතනයන් හි ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති දර්ශකය යාවත්කාලීන කර අපගේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධියට පත් කෙරේ.

**අදියර 2 – 2011 දෙසැම්බර් 31 දින දක්වා**

මෙම අදියර තුළ දී දෙවනුව වැදගත් වන ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති අවශ්‍යතා 70 ක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව ඇගයීමක් සිදු කෙරෙනු ඇත. එම ඇගයීමට අනුව 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතනයන්හි ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති දර්ශකය යාවත්කාලීන කර ප්‍රසිද්ධියට පත් කෙරේ.

**අදියර 3 – 2012 ජූනි 30 දින දක්වා**

මෙම අදියර තුළ දී සියලුම ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව ඇගයීමක් සිදු කෙරෙනු ඇත. එම ඇගයීමට අනුව 2012 ජූනි 30 දිනට රාජ්‍ය ආයතනයන්හි ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති දර්ශකය යාවත්කාලීන කර ප්‍රසිද්ධියට පත් කෙරේ.

→ 2

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඉ-තැපෑල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

මෙහි පළමු ඇගයීම සඳහා සලකා බැලෙන ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති අවශ්‍යතා 40 පිළිබඳ විස්තර හා එම අවශ්‍යතා සමග අනුගත වීමේ නිදසුන් හා දර්ශක දැක්වෙන ඇමුණුමක් ද මේ සමග ඔබ වෙත එවා ඇත. 2011 ජූලි 15 දිනට පෙර එම ආකෘතියේ මුද්‍රිත පිටපත සම්පූර්ණ කර උදාහරණ දැක්වෙන ඇමුණුම් ද සමග රාජ්‍ය අංශය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන් අධ්‍යක්ෂ වසන්ත දේශප්‍රිය මහතා වෙත එවන මෙන් දන්වමි.

ඔබ එසේ සපයන තොරතුරු පාදක කර ගනිමින් ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගත වීමේ දර්ශකය සකසා එය ප්‍රසිද්ධ කිරීමට පියවර ගැනේ. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර දැන ගැනීමට අවශ්‍ය වේ නම් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ව්‍යාපෘති කළමනාකාර සමීර ජයවර්ධන මහතා අමතන මෙන් කාරුණිකව දන්වමි. (දුරකතන: 011-2369099 දිගුව 250 ඉ-තැපැල්: sameeraj@icta.lk)

ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව කරුණු සාකච්ඡා කිරීම සඳහා ප්‍රධාන නවීකරණ නිලධාරීන් වෙනුවෙන් අන්තර්ජාල සංසදයක් ද පිහිටුවා ඇති අතර http://www.icta.lk/forum/index යන වෙබ් ලිපිනය හරහා එම සංසදයට සම්බන්ධ විය හැක. ඇමුණුමෙහි දැක්වෙන ප්‍රධාන ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් 40 පිළිබඳ ව එම සංසදය තුළ දැනට සාකච්ඡා වේ.

සිය ඉ-තැපැල් ලිපින සපයා ඇති ආයතනවලට මෙම ලිපිය ඉ-තැපැල මගින් ද එවා ඇත.

ලලිත් වීරතුංග
ජනාධිපති ලේකම් සහ
සභාපති, ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව

පිටපත්:

1. නිමල් අතුකෝරල මහතා, ලේකම්, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය - දැ.ගැ.පි.
2. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව - දැ.ගැ.පි.
3. වසන්ත දේශප්‍රිය මහතා, අධ්‍යක්ෂ, රාජ්‍ය අංශය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය- දැ.ගැ.පි. හා අ.ක.ස.